මාවතගම ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 29 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 15 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මාවතගම ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මාවතගම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ). ස්ථාවර වත්කම් ලේඛණය අනුව, සභාවේ 2010 වර්ෂයේ ඉඩම් ගොඩනැගිලි අත්පත් කරගැනීමේ අගය රු.6,999,200 ක් (ඉඩම් - රු.2,279,200, ගොඩනැගිලි - රු.4,720,000 ) ක් වුවද, ජ'නල් 57 අනුව එය රු.7,099,200 ක් ලෙස රු.100,000 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර වත්කම් යටතේ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව, පුස්තකාල පොත් හැර අනෙකුත් ස්ථාවර වත්කම් වල වටිනාකම ගණනය කිරීමකින් තොරව ඒවායේ පොත් අගය වූ රු.52,891,735 ක ගිණුම් ගතකර තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයට අදාලව වරපනම් යටතේ ලබාදී තිබූ රු.33,130 ක දුන් වට්ටම, වියදම් යටතේ ගිණුම් ගත නොකර සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් වලින් අඩුකර දක්වා තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂය අවසානයට වරපනම් ඉදිරියට ලැබීම් රු.936,307 ක් වුවද, එය ජංගම වගකීම් යටතේ ගිණුම් ගත නොකර ආදායම් ණය ගැතියන් ගෙන් අඩුකර ගිණුම් ගතකර තිබුණි.

1.3.2 <u>නොසැසඳු පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 18 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.44,322,725 ක් වූ අතර, උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.25,172,807 ක් විය.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතුව ගිණුම් ශේෂවල වටිනාකම රු.13,494,925 ක් විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.621,830 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.2,759,276 ක් විය.

2.2 මූල්‍ය පාලනය

(අ). දිගු කාලීනව තැන්පතු යටතේ පැවත එන ජල තැන්පතු වර්ග 06 ක් යටතේ පැවති රු.5,590,367 ක් හා ජාතික නිවාස සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.650,000 ක් හඳුනාගෙන සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ආ). බැංකු ගිණුම් 03 ක ට අදාලව නිකුත් කල නමුත් මාස 06 ක් ඉක්ම වු ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ රු.181,647 වටිනා චෙක්පත් 18 ක් පැවතුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තු ගත | 2010 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තු ගත | 2009 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 1,688 | 1,700 | 3,920 | 1,545 | 1,357 | 3,930 |
| (ii) | බදුකුලී | 4,799 | 4,632 | 2,272 | 6,389 | 6,281 | 2,233 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 890 | 891 | 98 | 930 | 968 | 98 |
| (iv) | වෙනත් ආදායම් | 36,220 | 3,298 | 23,971 | 33,814 | 33,031 | 26,171 |
| | එකතුව | 43,597 | 10,521 | 30,261 | 42,678 | 41,637 | 32,432 |

2.3.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසන් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ඇති රු.1,877,367 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.3.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 උනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.16,185,662 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.3.4 පොදු වෙළඳපල කඩ කාමර බදු

මාවතගම පොදුවෙළඳපල කඩ කාමර 42 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.516,092 ක හිඟ ශේෂයක් පැවති අතර එකී හිඟයන් වසර 1 සිට 10 දක්වා කාල පරාසයට විහිදී පැවතුණි. මෙකී හිඟ සම්බන්ධව ගිවිසුම් ප්‍රකාරව නඩු පවරා හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයට මස් මාළු කඩ 04 කට අදාලව රු.89,703 ක් හිඟව පැවති අතර ලේඛණ අනුව පෙර වර්ෂවල සිට පැවත එන රු.442,202 ක හිඟයක් පැවතියද ඊට අදාල තොරතුරු ඉදිරිපත් නොවුනි.

2.3.5 ජංගම වෙළඳ කුටි බදු

දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගන්නා ලද රු.700,000 ක ණය මුදලින් සකස් කරන ලද ජංගම වෙළඳ කුටි 20 ක් මාසිකව රු.1,104 ක් වූ වාරික 36 කින් හා මාසිකව රු.200 ක කුලී මුදල් ගෙවීමේ පදනම මත බදුකරුවන් වෙත ලබාදී තිබුණද එයින් වෙළඳ කුටි 17 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.240,120 ක කුලී මුදලක් හිඟව පැවතුණි.

2.3.6 වර්පනම් බදු

සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ වර්පනම් බදු වාර්ෂික බිල් කිරීම රු.1,604,241 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට හිඟය රු.3,541,800 ක් ලෙස වර්ෂ 2 ක වාර්ෂික බිල් කිරීම් වලට ආසන්න අගයක් ව පැවතුණි. මෙකී හිඟයන් 2009 වර්ෂයට පෙර සිට දිගු කාලීනව පැවත එන හිඟයන් වූ අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 33 - 41 රීති ප්‍රකාරව කටයුතු කර අදාල හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.7 අක්කර බදු

සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ වාර්ෂික අක්කර බදු බිල් කිරීම රු.33,318 ක් වූ අතර වාර්ෂික අයවීම බිල් කිරීම මත 16% ක් පමණ ලෙස රු.5,553 ක් වැනි අවම මට්ටමක පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානයට අක්කර බදු හිඟය රු.378,529 ක් වූ අතර එය වාර්ෂික බිල් කිරීම් හා සැසඳීමේදී වසර 11 ක බිල් කිරීම් වලට ආසන්න අගයක්ව පැවතුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 44 රීතියේ දක්වා ඇති පරිදි රීති මාලාවේ 33 සිට 41 ප්‍රකාරව කටයුතු කර අදාල හිඟ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.4 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත රු. 000 | තථ්‍ය රු. 000 | විචලනය රු. 000 | අයවැයගත රු. 000 | තථ්‍ය රු. 000 | විචලනය රු. 000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 34,741 | 29,486 | 5,255 | 35,951 | 27,896 | 8,055 |
| අනෙකුත් | 17,334 | 13,495 | 3,839 | 15,195 | 12,072 | 3,123 |
| උප එකතුව | 52,075 | 42,981 | 9,094 | 51,146 | 39,968 | 11,178 |
| ප්‍රාග්ධන වියදම | 38,200 | 21,941 | 16,259 | 37,325 | 24,435 | 12,890 |
| මුළු එකතුව | 90,275 | 64,922 | 25,353 | 88,471 | 64,403 | 24,068 |

2.5 අධිභාර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ172 ((3) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව 2010 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාර අගය රු.20,152 ක් විය.

2.6 මානව සම්පත් කළමණාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 02 | 02 |
| ද්විතියික | 10 | 09 |
| ප්‍රාථමික | 64 | 63 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 56 |

2.7 වත්කම් කළමණාකරණය

2.7.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.30,953,971 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.30,919,966 ක් විය.

2.7.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.33,167 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.22,567 ක් විය.

2.7.3 අචල ජංගම වත්කම්

(අ). සමාලෝචිත වර්ෂය අවසානයට, වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එන කොන්ක්‍රීට් ව්‍යාපෘතියට අදාල රු.1,719,098 ක ණය ගැති ශේෂයක් පැවති අතර එකී ශේෂයට අදාල තොරතුරු උපලේඛන ද විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ක්‍රීට් ව්‍යාපෘතියට අදාලව වර්ෂ කිහිපයක සිට පැවත එන රු.28,040 ක අමුද්‍රව්‍ය තොග ශෙෂයන් හා රු.31,428 ක නිමි ද්‍රව්‍ය තොග ශේෂයක් පැවතුණි.

(ඇ). සභාවේ පුස්තකාල 5 ක් මගින් බැහැර දී වසර ගණනාවක් ගතවී ඇති ආපසු ලබා නොදෙන ලද රු.40,293 ක් වටිනා පොත් 467 ක් ද පැවතුණි.

2.8 හඳුනාගත් පාඩු

සභාව සතු ජල පවිත්‍රාගාරය ඇතුළු පොම්පාගාර 04 කට අදාල විදුලි බිල්පත් අදාල කාල වකවානු වලදී නොගෙවීම මත විසන්ධිකල විදුලිය නැවත ලබාගැනීම සඳහා රු.2,107 ක මුදලක් සභා අරමුදලින් සමාලෝචිත වර්ෂය තුල දරා තිබුණි.

2.9 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2010 ජූනි 07 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක GGRC/21/05 දරන ලිපිය අනුව රාජ්‍ය හා පෞද්ගලික අංශ ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවීම සඳහා ආසියානු පදනම විසින් රු.10,000 ක මුදලක් ලබාදී තිබුණද, අදාල කාර්යය සඳහා එම සීමාව ඉක්මවා රු.37,740 ක මුදලක් අනුමැතියකින් තොරව වැයකර තිබුණි.

(ආ). මාවතගම පොදු වෙළඳපල පිටුපස හිස් භූමියේ කඩ කාමරයක් ඉදිකිරීම සඳහා ඉල්ලුම්කරුවෙකු වෙත 2010 ජූනි 29 දින අංක 4.27 සභා තීරණයෙන් අවසර දී තිබුණද, ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 80/46 චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කර නොතිබුණි.

2.10 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 3,017,544 ව තිබුණි. එමෙන්ම සභාවට අදාල මාසික වාරිකය ලෙස රු. 9,710 බැගින් එකී අරමුදල විසින් අය කර පැවතියද, එකී අය කිරීම් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න සභාව දැණුවත් වී නොතිබුණි.

(ආ) සභාව සතුව වාහන 08 ක් පැවති අතර එම වාහන සභා අවශ්‍යතා සඳහා වෙන්කිරීමේදී ආකෘති පත්‍ර භාවිත නොකිරීම, වගකිව යුතු නිළධාරියකුගේ අනුමැතිය නොලැබීම, පිටවීමේදී හා නැවත පැමිණීමේදී ගේට්ටු පරීක්ෂාවකට ලක් නොවීම, ඉන්ධන සඳහා අනුමත ඇණවුම් භාවිතා නොකිරීම, එදිනෙදා මුදල් පදනමට ඉන්ධන ලබාගැනීම, මාස 06 කට වරක් ඉන්ධන දහනය පරීක්ෂා කර නොගැනීම හා සභාවට ආධාර වශයෙන් ලැබුණ අංක 53-6115 දරණ ගිලන් රථය ධාවනයෙන් තොරව ගරාජයේ තබා තිබීම වැනි අඩුපාඩු පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව පොත් අගය රු.52,891,735 ක් වූ වත්කම් වලට අදාලව භාණ්ඩ සමීක්ෂණයක් කර පැවතියද අදාල සමීක්ෂණ වාර්තා අනුව ඒවා වටිනාකම් ගණනය කර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව රු.42,600 ක් වටිනා පොත් 500 ක් පමණ අස්ථාන ගත වී ඇති බව වාර්තා වී තිබුණි.

(ඈ). සමාලොචිත වර්ෂයේ අගෝස්තු 18 දින සභාවේ ගබඩාව භෞතික පරීක්ෂාවේදී තොග විෂයයන් 21 කට අදාලව තොග පොත් අනුව හා එදිනට භෞතික ශේෂය අනුව ඒකක 365 ක නොසැසඳීම් පැවති අතර ගබඩා ලැබීම් සටහන් 881 යටතේ විෂයයන් 11 ක් විධිමත් මිලදී ගැනීම් ක්‍රියාවලියකින් තොරව ගබඩාවට ලැබී තොග පොත් වල ඇතුලත් කර තිබුණි.

## 2.11 <u>කාර්ය සාධනය</u>

ජාතික සවිය ගම නැගුම - දෙවන අදියර යටතේ 2010 දෙසැම්බර් 31 දින අවසන් කර භාරදිය යුතු ව්‍යාපෘති 56 ක් වෙනුවෙන් රු.37,800,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණද, ඉන් ව්‍යාපෘති 08 කට පමණක් ගිවිසුම් අත්සන් කර තිබූ අතර, එයින් ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද වැඩ අරඹා තිබුනේ ව්‍යාපෘති 04 ක් පමණකි.

## 2.12 <u>අභ්‍යන්තර විගණනය</u>

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 03. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමණාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය